**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

# ලංසු කැඳවීමයි

**<u>පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීම 2023/2024</u>**

01. 2023/2024 වසර සඳහා මෙම විශ්වවිද්‍යාලය වෙත පෞද්ගලික ආරක්ෂක සේවාවන් සැපයිය හැකි රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති ආයතන වෙතින්, ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමයට ලංසු කැඳවනු ලැබේ.

02. ආපසු නොගෙවනු ලබන රුපියල් පන්දහසක (රුඃ 5,000.00) ලංසු ගාස්තුවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් වෙත මුදලින් ගෙවා, 2023.01.16 දින සිට 2023.02.06 දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ. ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා එම අංශයෙන් ලංසුපත් ලබාගත හැකිය. ලංසු අයදුම්පත් විශ්වවිද්‍යාල නිල වෙබ් අඩවියෙන් (www.pdn.ac.lk) ද බාගත හැකිය. එසේ වෙබ් අඩවියෙන් බාගත කර ගන්නේ නම්, 'මූල්‍යාධිකාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය' වෙත ආපසු නොගෙවන රුපියල් පන්දහසක (රුඃ 5,000.00) වටිනාකමකින් යුත් බැංකු අණකරයක් ලංසුව සමඟ අමුණා එවිය යුතුය.

03. අදාල ලංසු මිල ගණන් 2023.02.07 වන දින පස්වරු 1.00ට පෙර ලැබෙන සේ, **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ, ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකිය. ලංසු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "**<u>පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීම 2023/2024,</u>** UOP/GSD/SEC/2023/2024" යනුවෙන් සඳහන් කිරීම අනිවාර්යය වේ.

04. මෙම ලංසුපත් 2023.02.07 දින පස්වරු 1.30ට පේරාදෙණිය විශ්වවිද්‍යාල සනාතන මන්දිරයේ දී විවෘත කරනු ලැබේ. ලංසු අයදුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට මෙම අවස්ථාවට සහභාගි විය හැකිය.

05. සියළුම ලංසු සමඟ වාර්ෂික ලංසු වටිනාකමින් (බදු රහිත) 1% ක වටිනාකමකින් යුත්, අවලංගු කළ නොහැකි, විශ්වවිද්‍යාලය විසින් කරනු ලබන ප්‍රථම ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂිතයක්, (මෙය ලංසු විවෘත කළ දින සිට ඉදිරියට දින 120 ක් සඳහා වලංගු විය යුතුය) ලංසු අයදුම්පතේ දක්වා ඇති ආකෘතියට අනුව "උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය" නමින් තැබිය යුතු අතර එය ශ්‍රී ලංකා මහබැංකුව මගින් අනුමත කර ඇති රාජ්‍ය හෝ වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද ලංසු සුරක්ෂිතයක් විය යුතුය.

    රක්ෂණ සමාගම් මගින් ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂිත හෝ චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. අදාල ලංසු පටිපාටියෙහි විෂය පථයන් පැහැදිලි කරදීම සහ සේවා ස්ථාන හඳුනා ගැනීම යනාදිය සඳහා පූර්ව ලංසු මණ්ඩල රැස්වීමක් 2023.01.26 දින පෙ.ව. 10.00 ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි සනාතන මන්දිරයේ දී පැවැත්වේ. මෙම රැස්වීම සඳහා සියළුම ලංසුකරුවන්ගේ පැමිණීම අපේක්ෂා කෙරේ.

07. මේ පිළිබඳව වැඩි විස්තර 081-2392436 හෝ 081-2392446 ඇමතීමෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරී/ සාමාන්‍ය සේවා අංශය වෙතින් ලබාගත හැකිය.

සභාපති<br>
ප්‍රසම්පාදන කමිටුව<br>
පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>
පේරාදෙණිය

